*සැ. යු.* - 2019.04.12 දින පළ වූ අංක 2,119 දරන *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,120 - 2019 අප්‍රේල් මස 18 වැනි බ්‍රහස්පතින්දා - 2019.04.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 886 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බදුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 896 |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 900 |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 මැයි මස 10 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 අප්‍රේල් මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

885 - B 81515— 5,403 (2019/04)

# තනතුරු - ඇබෑර්තු

## බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01.

I. සේවා ගණය හා තනතුරු නාමය : ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය - සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය

II. පුරප්පාඩු සංඛ්‍යාව - 04

III. වැටුප් පරිමාණය හා කේත අංකය - PL 1-2016 - රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 (2016 වැටුපු පරිවර්තනයන්ට අදළව 2019 වර්ෂයට හිමි ආරම්භක වැටුප රු. 21,746.00)

IV. අධ්‍යාපන සුදුසුකම් - 8 වන ශ්‍රේණිය (9 වසර සමත් වී තිබිය යුතුය.)

V. බඳවා ගැනීමේ ක්‍රමය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 05 බැගින්) | 15 | 50% |
| තනතුරට අදළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

VI. පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව පත්වීම් කරනු ලබන අතර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාද මෙහිදී සලකා බලනු ලැබේ.

02.

I. සේවා ගණය හා තනතුරු නාමය - ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය වැඩ/ක්ෂේත්‍ර කම්කරු III ශ්‍රේණිය

II. පුරප්පාඩු සංඛ්‍යාව - 03

III. වැටුප් පරිමාණය හා කේත අංකය - PL 1-2016 - රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 (2016 වැටුප් පරිවර්තනයන්ට අදළව 2019 වර්ෂයට හිමි ආරම්භක වැටුප - රු. 21,746.00)

IV. අධ්‍යාපන සුදුසුකම් - 8 වන ශ්‍රේණිය (9 වසර සමත් වී තිබිය යුතුය.)

V. බඳවා ගැනීමේ ක්‍රමය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 05 බැගින්) | 15 | 50% |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

VI. පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව පත්වීම් කරනු ලබන අතර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාද මෙහිදී සලකා බලනු ලැබේ.

03.

I. සේවා ගණය හා තනතුරු නාමය - ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය කාර්යාල සේවක සේවයේ කාර්යාල කාර්ය සහායක III ශ්‍රේණිය

II. පුරප්පාඩු සංඛ්‍යාව - 02

III. වැටුප් පරිමාණය හා කේත අංකය - PL 1-2016 - රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 (2016 වැටුප් පරිවර්තනයන්ට අදාළව 2019 වර්ෂයට හිමි ආරම්භක වැටුප රු. 21,746.00)

IV. *අධ්‍යාපන සුදුසුකම් .-* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම. (මින් විෂයයන් 05ක් එකවර සමත් විය යුතුය.)

බඳවා ගැනීමේදී අ.පො.ස. (සා/පෙළ) සමතුන් නොමැති වුවහොත් 8 ශ්‍රේණිය සමතුන් බඳවා ගැනීම සඳහා සලකා බලනු ලැබේ.

V. බඳවා ගැනීමේ ක්‍රමය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් | 20 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

VI. පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව පත්වීම් කරනු ලබන අතර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාද මෙහිදී සලකා බලනු ලැබේ.

04. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

1. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2019.05.10 වැනි දිනට වයස අවු. 18ට නොඅඩු අවු. 45ට නොවැඩි විය යුතුය.
2. අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
3. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
4. විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබුවෙකු නොවිය යුතුය.
6. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු නොලැබූ අයෙකු විය යුතුය.

7. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

8. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

9. මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

05. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් (එම පිටපත් තමා විසින්ම සත්‍ය පිටපත් බවට අත්සන් තබා තිබිය යුතුය.) අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

- උප්පැන්න සහතිකය;
- අධ්‍යාපන සහතික;
- තම පදිංචිය සහතික කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම් සනාථ කෙරෙන ග්‍රාම නිලධාරී සහතිකය;
- මෑතක දී ලබා ගත් චරිත සහතික (02) ක්;
- වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික'

06. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පතක් 2019.05.10 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලේකම්, ප්‍රාදේශීය සභාව, බුලත්සිංහල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

එන්. එන්. ඉද්දගොඩ,<br>
ලේකම්,<br>
බුලත්සිංහල ප්‍රාදේශීය සභාව.

2019 අප්‍රේල් මස 05 වැනි දින,<br>
බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**බුලත්සිංහල ප්‍රාදේශීය සභාව**

***........................තනතුර සඳහා අයදුම් පත්‍රය***

1. අයදුම්කරුගේ නම මුලකුරු සහිතව :——————————————————

2 මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————————————

3. තැපැල් ලිපිනය :——————————————————

4. දුරකථන අංකය :——————————————————

5. උපන් දිනය :

2019.05.10 දිනට වයස ः අවු. ः...........................මාස ः...........................දින ः.........................

6. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————————

7. ජාතිය :——————————————

8. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද ?:——————————————

පරම්පරාවෙන් ද ?/ලියාපදිංචියෙන් ද යන වග :——————————————

9. අධ්‍යාපන සුදුසකම් (සහතිකවල ඡායා පිටපත් අමුණන්න.) :——————————————

10. ඔබ දැනටමත් බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් දරන තනතුර :————————

සේවා කාලය :......................... , එම පත්වීම ස්ථිර/තාවකාලික/අනියම් ද යන වග:————————————

11. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :——————————————

ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට අදාළ *ගැසට් පත්‍රයේ* සඳහන් සියලු කොන්දේසි සපුරා ඇති බවට හා මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

________________,

අයදුම්කරුගේ අත්සන.

දිනය :______________.

(දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය)

මෙහි ඉල්ලුම්කරු වන ........................................ මහතා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ (ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත) ........................................දින සිට ....................................කු වශයෙන් සේවය කරයි. ඔහු/ඇය අයදුම් කරන තනතුර සඳහා තෝරගනු ලැබුවහොත්, මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැක./නොහැක. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කරමි.

____________________,

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :____________________
තනතුර :____________________
දෙපාර්තමේන්තුව :____________________
(නිල මුද්‍රාව තබන්න)
දිනය :____________________

04-693

---

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

දිවුලපිටිය ප්‍රාදේශීය සභාව

දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

*පොදු සුදුසුකම් :*

01. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
02. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්නයේ වූ වසර 03ක කාලය තුළ බස්නාහිර පළාතේ ස්ථිර පදිංචියක් තිබිය යුතුය.
04. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය.
05. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.
06. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතුය.

| *තනතුරු නාමය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| 01. කාර්යාල කාර්ය සහායක (කාර්යාල සේවක සේවය III) පිරිමි/ගැහැණු අයදුම්කරුවන් | 01 | PL-1-2016 රු. 24,250-10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,410 (රා.ප.ච. 3/2016 හි උප ලේඛන 11 අනුව ආරම්භක වැටුප රු. 14,234 කි.) | අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හය (06)ක් සමත්වී තිබීම. (මින් විෂයයන් පහ(05)ක් එකවර සමත් විය යුතුය.) |

- කාර්යාල කාර්ය සහායක තනතුරු සඳහා පහත පරිදි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් වැඩිම ලකුණු ලබා ගන්නා පිළිවෙලට පත්වීම් කරනු ලැබේ:-

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් | 20 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

*සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :*

01. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. නියමිත පරිදි වැන්දඹු/වැන්දඹු පුරුෂ අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
02. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.
03. මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හා රීති රෙගුලාසිවලට ද, පළාත් පාලන ආයතනවලට අදාළ පනත්වලට හා රීති රෙගුලාසි විධිවිධානවලට ද, දිවුලපිටිය ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද නියෝග වලට ද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතුය.

*අයදුම්පත් එවිය යුතු පිළිවෙල :*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍රය සම්පූර්ණ කර ලිපිනය සඳහන් කල රු. 45.00ක වටිනාකමින් යුතු මුද්දර ඇලවූ ලියුම්කවරයක් සමග "ලේකම්, දිවුලපිටිය ප්‍රාදේශීය සභාව, මීරිගම පාර, දිවුලපිටිය" යන ලිපිනයට 2019.04.30 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සහ මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල අනු පිටපත් අමුණා එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික;
3. හැඳුනුම්පතේ පිටපතක්;
4. ග්‍රාම නිලධාරි සහතිකය;
5. අයදුම්කරන තනතුරට අදාල ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා සහතික;
6. චරිත සහතික දෙකක් (මෑතකදී ලබාගත්).

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ අතරතුරදී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ බලතල දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් යථා කාලයේදී සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

කේ. ඒ. උපුල් රංජිත්,
ලේකම්,
දිවුලපිටිය ප්‍රාදේශීය සභාව.

2019 අප්‍රේල් මස 02 වැනි දින,
දිවුලපිටිය ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**දිවුලපිටිය ප්‍රාදේශීය සභාව**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ........................................ තනතුර සඳහා අයදුම්පත්‍රය - 2019***

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම:————————————.
2. ස්ථිර ලිපිනය :————————————.
3. ග්‍රාම නිලධාරී වසම හා අංකය:————————————.
4. උපන් දිනය ඃ අවුරුද්ද :—————— . මාසය :—————— . දිනය :—————— .
5. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස ඃ අවු. :—————— . මාස :—————— දින :——————.
6. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————
7. ජාතික හැඳුනුම්පත් අංකය :——————————
8. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උපතින් ද, ලියාපදිංචි වීමෙන් ද යන වග :—————— .
9. අධ්‍යාපන සුදුසුකම් : වර්ෂය :—————— විභාග අංකය :——————

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

10. වෙනත් සුදුසුකම් :——————————
11. වෘත්තීය සුදුසුකම් :——————————
12. සේවා පළපුරුද්ද :——————————
13. දුරකථන අංකය :——————————

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බව දනිමි.

................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ*

මෙම අයදුම්කරු වන ........................................................................ මයා./මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ........................................................................ වශයෙන් සේවය කරනු ලබයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය :——————————.

...............................

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන

04-806

---

**දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

අක්මීමන ප්‍රාදේශීය සභාව

01. දකුණු පළාත් රාජ්‍ය සේවයේ අක්මීමන ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *සේවා ගණය හා ශ්‍රේණිය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමාණය* | *අවම අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද* |
|---|---|---|---|---|---|---|
| 01 | රියැදුරු | ප්‍රාථමික ශිල්පීය III ශ්‍රේණිය | 01 | PL - 3 2016 | රු. 25,790 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,990.00 | (i) දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් විෂයයන් 06ක් සමත්වීම; සහ<br>(ii) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් හා නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතු යි. (රියැදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද ලබා තිබිය යුතු යි.) |
| 02 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණිය | 04 | PL - 1 2016 | රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,410.00 | 08 වැනි ශ්‍රේණිය (09 වසර) සමත්වීම |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *සේවා ශ්‍රේණිය හා ශ්‍රේණිය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමාණය* | *අවම අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද* |
|---|---|---|---|---|---|---|
| 03 | මුරකරු | ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණිය | 01 | PL 1-2016 | රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,410.00 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් හය (06)ක් සමත් විය යුතු යි. |
| 04 | ආයුර්වේද සංයෝජක | ප්‍රාථමික අර්ධ ශිල්පීය III ශ්‍රේණිය | 01 | PL2-2016 | රු. 25,250 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,450.00 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් (06)ක් සමත් වීම. |
| 05 | සෞඛ්‍ය කම්කරු | ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණිය | 02 | PL1-2016 | රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,410.00 | 08 වැනි ශ්‍රේණිය (09 වසර) සමත් වීම |

02. *වයස් සීමාව :*

i. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතු ය.

ii. දැනට රාජ්‍ය සේවයේ නියුතු අයට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

03. *පොදු සුදුසුකම් :*

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකිකයන් විය යුතු අතර අයදුම්පත් කැඳවන අවසාන දිනට දකුණු පළාත් සභා බල ප්‍රදේශයේ පූර්වාසන්න වසර 03ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතු යි. අක්මීමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.

iii. අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු වී දඬුවම් ලැබුවෙකු හෝ රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබුවෙකු නොවිය යුතු ය.

iv. අයදුම්කරුවන් අදාළ තනතුර සඳහා පහත සඳහන් වී ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

04. *පොදු කොන්දේසි :*

i. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය අක්මීමන ප්‍රාදේශීය සභාවේ සභාපති සතු ය.

ii. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මාස 03ක් ඇතුළත රජයේ වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බැව් පෙනී ගිය හොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

05. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිරය.

ii. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීන්දු වලට ඔබ යටත් විය යුතු ය. තව ද ඔබ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප්/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

iii. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන අතර, එම කාලය තුළ දී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේදී සේවය ස්ථිර කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ නියුතු තැනැත්තන් එක් වසරක වැඩ බැලීමේ කාලයකට යටත් කර බඳවා ගනු ලැබේ.

iv. මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද රජය හෝ දකුණු පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව සේවය කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතු ය.

06. *බඳවා ගැනීමේ ක්‍රමය :*

i. නියමිත සුදුසුකම් සපුරන අයදුම්කරුවන් විධිමත් සම්මුඛ පරීක්ෂණයක් හා වෘත්තීය ප්‍රවීණතා තහවුරු කර ගැනීමේ ප්‍රතිඵල මත බඳවා ගැනේ.

07. *ලකුණු ලබා දීමේ ක්‍රමවේදය :*

01. i. ප්‍රාථමික ශිල්පීය සේවා ගණය - අයදුම්පත් කැඳවීමෙන් පසුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය ප්‍රවීණතා තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ.

ii. තනතුරට බඳවා ගැනීම සඳහා වූ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පටිපාටිය.

| | | |
|---|---|---|
| 1.1 | අ.පො.ස. සා. පෙළ සාමාර්ථය සඳහා | (8x1) = 8 |
| 1.2 | අ.පො.ස. සා. පෙළ සම්මාන සාමාර්ථය සඳහා | (8x2) = 16 (උපරිම) |
| | අ.පො.ස. උ.පෙළ සමත් වීම | = 4 |
| 2. | වෘත්තියට අදාළ දැනුම | = 10 |
| 3. | පෞරුෂත්වය | = 05 |
| 4. | වෘත්තියට අදාළව පුහුණුවක් හෝ සේවා පළපුරුද්දක් තබා තිබීම | = 15 |
| | (වසරකට ලකුණු 02 බැගින්) මුළු එකතුව | = 50 |

සමත් වීම සඳහා 40% (ලකුණු 20) ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගත යුතු ය.

i. වෘත්තීය ප්‍රවීණතා පරීක්ෂණය :
මෙහි දී වෘත්තියට අදාළ දැනුම පරීක්ෂා කරනු ලැබේ.
මුළු ලකුණු 50, සමත්වීම සඳහා 40% (ලකුණු 20) ලබා ගත යුතු ය.

02. ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය :

| | *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. | අධ්‍යාපන සුදුසුකම් | 30 | 50% |
| 2. | අමතර සුදුසුකම් | 10 | |
| 3. | පළපුරුද්ද | 10 | |
| 4. | සභා බල ප්‍රදේශයේ පදිංචිය | 45 | |
| 5. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |
| | එකතුව | 100 | |

*සටහන* :- මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදීම සිදු කෙරේ.

08. දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

09. මෙම දැන්වීම් නිවේදනයේ සිංහල, දෙමළ භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු යි.

10. *ඉල්ලුම් කරනු ලබන ආකාරය* :-

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පත් 2019.05.06 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලේකම්, අක්මීමන ප්‍රාදේශීය සභාව, පින්නදූව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය ෘ

i. උප්පැන්න සහතිකය ;
ii. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත;
iii. අධ්‍යාපන සහතික හා පාසල් හැර යාමේ සහතිකය;
iv. පදිංචිය සනාථ කිරීමේ සහතිකය (පදිංචි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි විසින් මාස 06ක් තුළ දී නිකුත් කරන ලදුව ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතු ය.);
v. මෑතක දී ලබා ගත් චරිත සහතික දෙකක්;
vi. වෘත්තීය හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සහතික (තිබේ නම්) ;
vii. පොලිස් සහතිකය.

සමරසේන කළහෙවත්ත,
සභාපති,
අක්මීමන ප්‍රාදේශීය සභාව.

2019 මාර්තු මස 28 වැනි දින,
අක්මීමන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***දකුණු පළාත් රාජ්‍ය සේවයේ අක්මීමන ප්‍රාදේශීය සභාවේ තනතුරු පුරප්පාඩු සඳහා අයදුම්පත***

01) (i) මුලකුරු සමග නම :——————————————

(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————————

02) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————————

03) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————————————

04) ස්ථිර පදිංචි ලිපිනය :——————————————

05) ජාතික හැඳුනුම්පත් අංකය :——————————————

06) ස්ත්‍රී/පුරුෂභාවය :——————————————.

07) උපන් දිනය : වර්ෂය :——————. මාසය :——————. දිනය :——————

08) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස ෘ අවුරුදු :—————— මාස:—————— දින :——————

09) ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් වන්නේ පරම්පරාවෙන්ද ? ලියාපදිංචි වීමෙන් ද ? :——————

10) අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) :- (සහතිකවල පිටපත් අමුණන්න.) :——————

11) වෘත්තීය හා වෙනත් සුදුසුකම් :- (සහතිකවල පිටපත් අමුණන්න.) :——————

12) ඉල්ලුම්කරු දැනට රැකියාවක නියුතු නම්,

i. තනතුර :——————

ii. සේවය කරන ස්ථානය :——————

iii. පත්වීමේ දිනය :——————

13) ඔබ කවරදාක හෝ සාපරාධී වරදක් හෝ චෝදනාවක් සම්බන්ධයෙන් අධිකරණයෙන් වරදකරුවකු කරනු ලැබ තිබේ ද? : :——————

14) *අයදුම්කරුගේ සහතිකය* :- මෙම අයදුම්පතේ ම' විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මාගේ අයදුම්පත අවලංගු වීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට යටත් වන බවත්, මම දනිමි.

——————

අයදුම්කරුගේ අත්සන.

දිනය :——————

15) රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.

මෙම අයදුම්කරු දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවයේ නියුක්ත බව ද, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බව ද, මෙම තනතුර සඳහා තෝරා ගතහොත් දැනට දරන තනතුරෙන් ඔහු/ඇය නිදහස් කළ හැකි/නොහැකි බව ද ප්‍රකාශ කරමි.

——————

ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :——————

04-498

# පළාත් පාලන නිවේදන

## ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභාව

### මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්හි ප්‍රජා මණ්ඩල පිහිටුවීම, ලියාපදිංචි කිරීම, ඒවායේ කාර්ය හා කර්තව්‍යය තීරණය කිරීම සහ නියාමනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව

**නිවේදනය**

***1952 අංක 06 දරන පළාත් පාලන ආයතනය (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත***

261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වගන්තියෙන් (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ පෙබරවාරි මස 14 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 5.3.1 යටතේ ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්හි ප්‍රජා මණ්ඩල පිහිටුවීම,

ලියාපදිංචි කිරීම, ඒවායේ කාර්ය හා කර්තව්‍ය තීරණය කිරීම සහ නියාමනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව පිළිගෙන වැළඳ ගැනීම සහා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. එස්. බුද්ධික සේනාරත්න,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
ලග්ගල පල්ලේගම.

2019 වර්ෂයේ පෙබරවාරි මස 14 වැනි දින,
ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2018.09.25 දින අංක 2090/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv (අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්හි ප්‍රජා මණ්ඩල පිහිටුවීම, ලියාපදිංචි කිරීම, ඒවායේ කාර්ය හා කර්තව්‍යය තීරණය කිරීම සහ නියාමනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යස්ථාව මෙම තීරණය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නේ ය.

04-734/1

---

**ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභාව**

මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්හි ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

**නිවේදනය**

***1952 අංක 06 දරන පළාත් පාලන ආයතනය (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත***

261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වගන්තියෙන් (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ පෙබරවාරි මස 14 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 5.3.2 යටතේ ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්හි ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මෙම සභාව විසින් පිළිගෙන වැළඳ ගැනීම සහා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂයේ පෙබරවාරි මස 14 වැනි දින,
ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

එස්. එම්. එස්. බුද්ධික සේනාරත්න,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
ලග්ගල පල්ලේගම.

**යෝජනාව**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2018.06.28 දින අංක 1816/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv (අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දාවූ මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්හි ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යස්ථාව මෙම තීරණය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නේ ය.

04-734/2

**මාතර මහා නගර සභාව**

1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ වීථි නම් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී.

මහ නගර සභා ආඥාපනතේ 252 අධිකාරිය ප්‍රකාර 71 (1) වගන්තිය යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා 1975 හි අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ විධිවිධාන පරිදි දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමා විසින් ලබා දෙන අනුමැතිය ප්‍රකාර පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති පරිදි, වර්තමාන නමින් ඇති මාවත් අලුතින් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

සේනක පල්ලියගුරුගේ,
මාතර මහා නගර සභාව.

2019 පෙබරවාරි මස 11 වැනි දින,
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| *අංකය* | *පළාත් පාලන ආයතනයේ නම* | *දිස්ත්‍රික්කය* | *වීථියේ වර්තමාන නම* | *අළුතින් යොදා ඇති නම* | *මාර්ග විස්තරය* |
|---|---|---|---|---|---|
| 1 | මාතර මහා නගර සභාව | මාතර | වල්ගම දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කරුවලගස් පාරට ඉදිරියෙන් පිහිටි මාර්ගය | නදුන් පෙදෙස | ආරම්භය - ගාල්ල - මාතර පාර<br>අවසානය : නිවාස |

04-495

---

**මාතර මහා නගර සභාව**

1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ වීථි නම් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී.

මහ නගර සභා ආඥාපනතේ 252 අධිකාරිය ප්‍රකාර 71 (1) වගන්තිය යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා 1975 හි අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ විධිවිධාන පරිදි දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමා විසින් ලබා දෙන අනුමැතිය ප්‍රකාර පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති පරිදි, වර්තමාන නමින් ඇති මාවත් අලුතින් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

සේනක පල්ලියගුරුගේ,
මාතර මහා නගර සභාව.

2019 පෙබරවාරි මස 11 වැනි දින,
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| අංකය | පළාත් පාලන ආයතනයේ නම | දිස්ත්‍රික්කය | වීථියේ වර්තමාන නම | අළුතින් යොදා ඇති නම | මාර්ග විස්තරය |
|---|---|---|---|---|---|
| 1 | මාතර මහා නගර සභාව | මාතර | හිටපු නාගරික මන්ත්‍රී ටියුඩර් ගුණසේකර මැතිතුමාගේ අභාවයෙන් පසුව එතුමාගේ නිවස පිහිටි පාර | ටියුඩර් ගුණසේකර මාවත | ආරම්භය - තොටමුණ පාර<br>අවසානය : ජයමහා විහාර පාර |

04-496

---

## ප්‍රජා මණ්ඩල පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

වත්තේගම නගර සභාව

**1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

261 වන අධිකාරිය 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) 2 වන වගන්තියේ (01) වන උපවගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාරව හා 255 වන අධිකාරිය මහ නගර සභා ආඥාපනතේ 154 (1) උපවගන්ති ප්‍රකාරව 2019.02.22 මහා සභා තීරණ අංක ඉ xxiv යටතේ පහත සඳහන් තීරණය මෙයින් නිවේදනය කරනු ලැබේ.

බී. එම්. රවීන්ද්‍ර බණ්ඩාර,
සභාපති,
වත්තේගම නගර සභාව.

2019 මාර්තු මස 25 වැනි දින,
වත්තේගම නගර සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2018.09.25 දින අංක 2090/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ප්‍රජා මණ්ඩල පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මෙම තීරණය *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට වත්තේගම නගර සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට නගර සභා ආඥාපනතේ 154 (1) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් තීරණය කරමි.

04-493

**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව**

ගෝ ඝාතක ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් ස්ථානයේ එළ හරක් මස් වෙළෙඳාමක් සඳහා ව්‍යාපාරයක් පවත්වාගෙන යාම පිණිස 2019 වර්ෂය සඳහා බලපත්‍රයක් ලබාදෙන ලෙස ඉල්ලුම් කර ඇති අතර එම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම් කුමන කරුණක් නිසා දැයි යන වග පිටපත් 02 කින් යුක්තව ලියවිල්ලක් මගින් මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව ගෝ ඝාතක ආඥාපනතේ 272 වන අධිකාරියේ 7(1) වගන්තිය යටතේ දැනුම් දෙමි.

සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව,
රඹුක්පිටිය.

2019 ක් වූ මාර්තු මස 28 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ දී ය.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම* | *මස් වෙළෙඳාම් කරනු ලබන ස්ථානය* | *වෙළෙඳාමේ ස්වභාවය* |
|---|---|---|
| ජෙයිනුල් ආබ්දීන් අබ්දුල් රහිමාන් ලෙබ්බේ | නාවලපිටිය, ජයසුන්දර මාවතේ අංක 32 දරන (දැනට මෙම ස්ථානයේ අයිතිකරුවන ෆාතිමා ෆාහිමා මෙම ස්ථානය වන අංක 32, ජයසුන්දර මාවතේ මස් වෙළෙඳාම සඳහා එම ස්ථානය සිය පියා වන ජෙයිනුල් ආබ්දීන් අබ්දුල් රහිමාන් ලෙබ්බේ හට කැමැත්තෙන් ලබා දී ඇත.) | හරක් මස් වෙළෙඳාම |

04-499

---

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

**නිවිතිගල ප්‍රාදේශීය සභාව**

2018 දෙසැම්බර් මස 31 අවසන් වර්ෂ සඳහා මූල්‍ය ප්‍රකාශය

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2019.02.27 වැනි දින පැවැත් වූ මාසික සභා රැස්වීමේ දී තීරණ අංක 01.01 යටතේ සම්මත කරන ලද 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති යටතේ 167 වගන්තිය ප්‍රකාරව 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිවිතිගල ප්‍රාදේශීය සභාවේ ශේෂ පත්‍රය මහජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රකාශයට පත් කරමි.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

2019 මාර්තු මස 27 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

**2018 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂ පත්‍රය**

| | | 2018 | | 2017 |
|---|---|---|---|---|
| (1) 110 ස්ථාවර වත්කම් (සටහන 01) | | 151,823,483.92 | | 72,077,146.57 |
| (2) ජංගම වත්කම් | | | | |
| 120 අතැති තොග (සටහන 02) | 224,890.53 | | 303,452.73 | |
| 130 උපයෝගි සේවා සඳහා ණය (සටහන 03) | | | | |
| 140 සේවක ණය | 7,197,650.75 | | 3,914,502.98 | |
| 150 අයකර ගත හැකි උපයෝගි සේවා (සටහන 04) | | | | |
| 160 ආදායම් ණය ගැතියෝ (සටහන 05) | 22,042,530.91 | | 51,293,468.13 | |
| 170 පෙර ගෙවුම් (සටහන 06) | 9,223,664.12 | | 4,287,614.12 | |
| 180 ආයෝජන (සටහන 07) | 1,640,847.68 | | 1,590,291.43 | |
| 190 මුදල් (සටහන 08) | 18,294,071.99 | | 5,785,444.01 | |
| **ජංගම වත්කම් එකතුව** | **58,623,655.98** | | **67,174,773.40** | |
| (3) අඩු කළා : ජංගම වගකීම් | | | | |
| 230 ණය හිමියෝ (සටහන 9) | 12,247,986.49 | | 39,561,295.47 | |
| 240 කලින් ලැබීම් (සටහන 10) | 238,411.15 | | 195,022.89 | |
| 250 ආපසු ගෙවිය යුතු තැන්පත් (සටහන 11) | 11,475,292.98 | | 11,692,854.50 | |
| **ජංගම වගකීම් එකතුව** | **23,961,690.62** | | **51,449,172.86** | |
| කාරක ප්‍රාග්ධනය/ ඌන කාරක ප්‍රාග්ධනය (2-3) | | 34,661,965.36 | | 15,725,600.54 |
| ශුද්ධ වත්කම් | | **186,485,449.28** | | **87,802,747.11** |
| මුදල් යොදවන්නන් | | | | |
| 210 සමුච්චිත අරමුදල හා සංචිත (සටහන 12) | | 185,668,492.78 | | 86,888,407.50 |
| 220 ණය ප්‍රාග්ධනය (සටහන 13) | | 816,956.50 | | 914,339.61 |
| | | 186,485,449.28 | | 87,802,747.11 |

**නිවිතිගල ප්‍රාදේශීය සභාව - ශේෂ පත්‍ර සටහන්**

| | 2018 | 2017 |
|---|---|---|
| සටහන 1 | | |
| 110 ස්ථාවර වත්කම් | | |
| 111 ඉඩම් හා ගොඩනැගිලි | 78,223,877.00 | |
| 112 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 24,967,677.35 | 23,939,094.35 |
| 113 මෝටර් රථ හා කරත්ත | 21,117,980.00 | 21,116,230.00 |
| 114 ලී බඩු හා සවිකිරීම | 24,381,974.00 | 24,287,609.75 |
| 115 පුස්තකාල පොත් | 3,131,975.57 | 2,734,212.47 |
| එකතුව | **151,823,483.92** | **72,077,146.57** |
| | | |
| සටහන 2 | | |
| 120 අතැති තොග | | |
| අතැති ගබඩා ද්‍රව්‍ය | | |
| 121 පොදු ගබඩා | 177,364.80 | 255,927.00 |
| 122 ජල කර්මාන්ත ගබඩා | | |
| 123 විදුලිය ගබඩා | 47,525.73 | 47,525.73 |
| 124 ඕවර්සියර්ගේ ක්ෂේත්‍ර ගබඩා | | |
| එකතුව | **224,890.53** | **303,452.73** |
| සටහන 3 | | |
| 130 උපයෝගී ස්වා සඳහා ණය | | |
| 131 පුද්ගලික වීථි තැනීම් | | |
| 132 ආධාර නිවාස ජලාප්‍රවාහනය | | |
| 133 ජරාවාස ගොඩනැගිලි නඩත්තුව | | |
| 134 පුද්ගලික වීථි වල ජලනල යෙදීම | | |
| 135 ජල සේවා අළුත්වැඩියාව | | |
| | | |
| සටහන 4 | | |
| 150 අයකර ගතහැකි උපයෝගී සේවා | | |
| 151 අයකිරීමට තිබෙන වැඩ | | |
| 152 තොගය සඳහා උපකරණ තැනීම | | |
| 153 විවිධ | | |
| එකතුව | | |
| සටහන 5 | | |
| 160 ආදායම් ණය ගැතියෝ | | |
| 161 හිඟ හිටි වරිපනම් | 1,159,990.41 | 1,223,137.19 |
| 162 හිඟ හිටි අක්කර බදු | 159,612.68 | 143,958.23 |
| 163 හිඟ හිටි වෙනත් ආදායම් | 20,722,927.82 | 49,926,372.71 |

| | 2018 | 2017 |
|---|---|---|
| එකතුව | **22,042,530.91** | **51,293,468.13** |
| | | |
| සටහන 6 | | |
| 170 පෙර ගෙවුම් | | |
| 171 සභාවේ තැන්පත් | | |
| 172 සභාවේ පෙර ගෙවුම් (අත්තිකාරම්) | 9,223,664.12 | 2,287,614.12 |
| එකතුව | **9,223,664.12** | **4,287,614.12** |
| | | |
| සටහන 7 | | |
| 180 ආයෝජන | | |
| 181 ස්ථිර තැන්පත්වල ඇති සභාවේ මුදල් | 1,210,638.45 | 1,210,638.45 |
| 182 ස්ථිර තැන්පත්වල ඇති සේවක ඇප | 430,209.23 | 379,652.98 |
| 183 නිදන් අරමුදල | | |
| 184 වෙනත් | | |
| එකතුව | **1,640,847.68** | **1,590,291.43** |
| | | |
| සටහන 8 | | |
| 190 මුදල් | | |
| 191 ලංකා බැංකුවේ සංවර්ධන ගිණුම 71903756 | 17,412,314.89 | 4,935,867.23 |
| ලංකා බැංකුවේ ජංගම ගිණුම - 4667408 | 205,461.17 | 299,195.29 |
| 192 මහජන බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුම 192-261-0652 | 17,941.02 | 17,241.58 |
| ලංකා බැංකුවේ සැලසුම් කමිටු ගිණුම 73300762 | 643,037.50 | 517,822.50 |
| 193 කාණු පද්ධති ගිණුම - 008825270 | 15,317.41 | 15,317.41 |
| එකතුව | **18,294,071.99** | **5,785,444.01** |
| | | |
| සටහන 9 | | |
| 230 ණය හිමියෝ | | |
| 231 වියදම් ණය හිමියෝ | 12,247,986.49 | 39,561,295.47 |
| 232 පොදු සැපයුම් ණය හිමියෝ | | |
| 233 ජල සැපයුම් ණය හිමියෝ | | |
| 234 විදුලිය සැපයුම් ණය හිමියෝ | | |
| 235 නොගෙවූ වැටුප් හා වේතන | | |
| 236 වෙනත් | | |
| එකතුව | **12,247,986.49** | **39,561,295.47** |

04-492

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.